# ළමා පරිසරවේදියා තේරීමේ තරඟය

**මෙරට විද්‍යා හා තාක්ෂණ අංශය ශක්තිමත් කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රමුඛ පෙළේ රාජ්‍යය ආයතනයක් වන ජාතික විද්‍යා පදනම දැයේ දරුවන් තුල පරිසරය පිළිබඳව ඇල්මක් ඇතිකිරීමට සහ ඒ පිළිබඳව විද්‍යාත්මක ඇසකින් අධ්‍යනය කිරීමට උනන්දුවක් කුඩා කල සිටම වර්ධනය කිරීම උදෙසා කටයුතු කරයි. එම අරමුණු මුල්කොටගෙන "ළමා පරිසරවේදියා" නමින් තරඟයක් සිදුකිරීමට මෙවර කටයුතු යොදා ඇත. ඒ සඳහා ඔබගේ/පාසලේ දරුවාට පහත දක්වා ඇති නිර්ණායකවලට අනුකූලව සම්බන්ධ විය හැක.**

## තරඟ නිර්ණායක

1. අවුරුදු 06-10 අතර දරුවන් (1-5 ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන)
2. දරුවාව මේ සදහා යොමුකිරීමට සහ ඔහුට මගපෙන්වීම දෙමාපියන්, වැඩිහිටියකු හෝ පාසල් ගුරුවරයෙකු විසින් සිදුකල හැක.
3. දරුවා විසින් මාසයක් ඇතුලත සිදුකරන නිරීක්ෂණ වාර්තාවක් ලෙස (ලිවීම, චිත්‍ර හෝ පින්තූර භාවිතයෙන්) තරඟයට ඉදිරිපත් කළ හැක.
4. අවසන් වාර්තාව සකස් කිරීමේදී A4 කඩදාසියක එක් පැත්තක් පමණක් භාවිතා කරන්න.
5. වාර්තාවේ පිටු ගණන 10-20 අතර වීම ප්‍රමාණවත්ය.
6. එක් සිසුවෙකුට ලබා දිය හැක්කේ එක් ව්‍යාපෘතියක් පමණි.
7. අවසන් වාර්තාවට හොඳ නිමාවක් ලබා දීම සඳහා සුදුසු පිටු සැකසුම් හා ඇමුණුම් ක්‍රමවේදයක් භාවිතා කල හැක.
8. වාර්තාව සැකසීමට මඟ පෙන්වීමක් වශයෙන් ජාතික විද්‍යා පදනම විසින් ලබා දී ඇති ආකෘතිය දරුවාගේ නිර්මාණශීලීභාවයට හානි නොවන ලෙස යොදාගැනීම සිදුකරන්න.
9. ව්‍යාපෘතිය ශිෂ්‍යයාගේම ක්‍රියාකාරකමක් විය යුතුය.
10. සියළුම ව්‍යාපෘති දරුවන්ගේ ක්‍රියාකාරකම් ලෙස දෙමාපියන්ගේ සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතු අතර පාසල විවෘත කිරීමෙන් පසු පන්ති ගුරුවරයාගේ සහතිකය පාසල් විදුහල්පති විසින් සනාථ කර ජාතික විද්‍යා පදනමෙහි ඉල්ලීම පරිදි ඉදිරිපත් කළ යුතුය.
11. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2020 අගෝස්තු 15 වන දින හෝ ඊට පෙර සහ සකස් කරන ලද සම්පූර්ණ වාර්තාව 2020 සැප්තැම්බර් මස 18 වන දින හෝ ඊට පෙර විද්‍යුත් තැපෑලෙන් අපවෙත එවීමට සලස්වන්න.
12. විනිශ්චය මණ්ඩලයේ තීරණය තරඟයේ අවසාන තීරණය වන අතර ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු කිසිදු අභියාචනයක් සැලකිල්ලට නොගැනේ.
13. ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරනු ලබන ජාතික සම්මාන උළෙලකදී ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනැමේ.







NATIONAL SCIENCE FOUNDATION


**වැඩි විස්තර සඳහා:**

www.nsf.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

මධුකා සේනාරත්න
(දුරකථන: 0112696771 Ext 183)

අභිමානී රණතුංග
(දුරකථන: 0112696771 Ext 184)

ආචාර්ය පී.ආර්.එම්.පී. දිල්රුක්ෂි රණතුංග,
අංශ ප්‍රධානී, විද්‍යාව ප්‍රචලිත කිරීමෙ අංශය,
ජාතික විද්‍යා පදනම, 47/5,
මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07.
දුරකථන: 011-2209509; 2696771 දිගුව 180
විද්‍යුත් තැපෑල: dilrukshi@nsf.gov.lk